# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

## 07-ඉතිහාසය

## 2020

Curriculum
Assessment & Evalution
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද ඇඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් ඉතිහාසය විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද, තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය , I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද I ප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරි වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීකෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023.06.30

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981 දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසන් විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එච්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>පාලන හා විමර්ශන/ පර්යේෂණ හා සංවර්ධන |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග ශාඛා |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්.සී. ප්‍රියදර්ශනී<br>සහකාර විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන අංශය |
| සංස්කරණය | : | මහාචාර්ය යූ.බී. කරුණානන්ද<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br><br>ඩී.එච්.සී.එන්. ධර්මපාල<br>අධ්‍යක්ෂ (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මහරගම |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය දේවාලේගම චන්දිම හිමි<br>ගුරු උපදේශක<br>ර/ඤාණෝභාස මහ පිරිවෙන<br>මල්වාන, රත්නපුර<br><br>මහාචාර්ය යූ.බී. කරුණානන්ද<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br><br>මහාචාර්ය කේ.එම්.පී කුලසේකර<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය<br><br>ඩී.එච්.සී.එන්. ධර්මපාල<br>අධ්‍යක්ෂ (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මහරගම<br><br>ජයසේන ගුණවර්ධන<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| පරිගණක පිටපත සැකසුම | : | ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවරය සැකසුම | : | ආර්. එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>දත්ත සටහන් සහකාර |

# පටුන


පිටු අංක

**1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු 01

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 02

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02

1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 03

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 04

**I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 06

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 06

2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) 07

2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 11

2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 12

2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 13

2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය 14

2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 17

**II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 19

3.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 19

3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 20

3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 20

3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 21

3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා 22

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, ප්‍රශ්න වල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන 37

**4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් අවධානය යොමු කළ යුතු කරුණු** 38

**5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 39

# 1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු

- ★ මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිරවුල් ව නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම.
- ★ අතීතය මත පදනම්ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම් ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායී කරලීම.
- ★ ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් ද හිතකාමී පුරවැසියෙකු සතු කුසලතා වර්ධනය කිරීම.
- ★ ඓතිහාසික ව වැදගත් භූමිකා ඉටුකළ පුද්ගලයින්ගේ චරිතාපදාන චරිතායනයනය කිරීම.
- ★ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.
- ★ ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මකව බැලීම.
- ★ ඓතිහාසික ගෝලීය ප්‍රවනතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහාගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගැනීම.
- ★ අන්‍ය සංස්කෘතින්ට ගරු කිරීම.
- ★ කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
- ★ ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කිරීම.

## 1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2284 | 27 | 2311 |
| ඉංග්‍රීසි | 18 | 0 | 18 |
| එකතුව | 2302 | 27 | 2329 |

වගුව **1:1**

### 1.2.2. අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 105 | 4.56 | 0 | 0.00 | 105 | 4.51 |
| B | 230 | 9.99 | 3 | 11.11 | 233 | 10.00 |
| C | 897 | 38.97 | 14 | 51.85 | 911 | 39.12 |
| S | 703 | 30.54 | 6 | 22.22 | 709 | 30.44 |
| W | 367 | 15.94 | 4 | 14.81 | 371 | 15.93 |
| එකතුව | **2302** | **100.00** | **27** | **100.00** | **2329** | **100.00** |

වගුව **1:2**

## 1.2.3. පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 149 | 6 | 4.03 | 24 | 16.11 | 79 | 53.02 | 30 | 20.13 | 139 | 93.29 | 10 | 6.71 |
| ගම්පහ | 198 | 14 | 7.07 | 23 | 11.62 | 73 | 36.87 | 61 | 30.81 | 171 | 86.36 | 27 | 13.64 |
| කළුතර | 151 | 8 | 5.30 | 18 | 11.92 | 75 | 49.67 | 44 | 29.14 | 145 | 96.03 | 6 | 3.97 |
| මහනුවර | 277 | 23 | 8.30 | 38 | 13.72 | 129 | 46.57 | 56 | 20.22 | 246 | 88.81 | 31 | 11.19 |
| මාතලේ | 72 | 2 | 2.78 | 5 | 6.94 | 24 | 33.33 | 29 | 40.28 | 60 | 83.33 | 12 | 16.67 |
| නුවරඑළිය | 40 | 0 | 0.00 | 2 | 5.00 | 14 | 35.00 | 21 | 52.50 | 37 | 92.50 | 3 | 7.50 |
| ගාල්ල | 200 | 8 | 4.00 | 22 | 11.00 | 69 | 34.50 | 69 | 34.50 | 168 | 84.00 | 32 | 16.00 |
| මාතර | 158 | 2 | 1.27 | 9 | 5.70 | 53 | 33.54 | 53 | 33.54 | 117 | 74.05 | 41 | 25.95 |
| හම්බන්තොට | 124 | 4 | 3.23 | 7 | 5.65 | 41 | 33.06 | 41 | 33.06 | 93 | 75.00 | 31 | 25.00 |
| වව්නියාව | 03 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 66.67 | 1 | 33.33 | 3 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 71 | 1 | 1.41 | 4 | 5.63 | 36 | 50.70 | 20 | 28.17 | 61 | 85.92 | 10 | 14.08 |
| ත්‍රිකුණාමලය | 21 | 0 | 0.00 | 1 | 4.76 | 5 | 23.81 | 8 | 38.10 | 14 | 66.67 | 7 | 33.33 |
| කුරුණෑගල | 217 | 20 | 9.22 | 27 | 12.44 | 78 | 35.94 | 55 | 25.35 | 180 | 82.95 | 37 | 17.05 |
| පුත්තලම | 48 | 1 | 2.08 | 0 | 0.00 | 6 | 12.50 | 25 | 52.08 | 32 | 66.67 | 16 | 33.33 |
| අනුරාධපුරය | 152 | 5 | 3.29 | 14 | 9.21 | 68 | 44.74 | 39 | 25.66 | 126 | 82.89 | 26 | 17.11 |
| පොළොන්නරුව | 48 | 0 | 0.00 | 3 | 6.25 | 14 | 29.17 | 13 | 27.08 | 30 | 62.50 | 18 | 37.50 |
| බදුල්ල | 106 | 6 | 5.66 | 16 | 15.09 | 36 | 33.96 | 32 | 30.19 | 90 | 84.91 | 16 | 15.09 |
| මොණරාගල | 83 | 0 | 0.00 | 5 | 6.02 | 28 | 33.73 | 36 | 43.37 | 69 | 83.13 | 14 | 16.87 |
| රත්නපුරය | 110 | 3 | 2.73 | 10 | 9.09 | 43 | 39.09 | 35 | 31.82 | 91 | 82.73 | 19 | 17.27 |
| කෑගල්ල | 101 | 2 | 1.98 | 5 | 4.95 | 38 | 37.62 | 41 | 40.59 | 86 | 85.15 | 15 | 14.85 |
| **සමස්ත දිවයින** | **2329** | **105** | **4.51** | **233** | **10.00** | **911** | **39.12** | **709** | **30.44** | **1958** | **84.07** | **371** | **15.93** |

වගුව **1:3**

## 1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 2 | 0.09 | 2329 | 100.00 |
| 81 - 90 | 14 | 0.60 | 2327 | 99.91 |
| 71 - 80 | 76 | 3.26 | 2313 | 99.31 |
| 61 - 70 | 211 | 9.06 | 2237 | 96.05 |
| 51 - 60 | 438 | 18.81 | 2026 | 86.99 |
| 41 - 50 | 577 | 24.77 | 1588 | 68.18 |
| 31 - 40 | 579 | 24.86 | 1011 | 43.41 |
| 21 - 30 | 313 | 13.44 | 432 | 18.55 |
| 11 - 20 | 112 | 4.81 | 119 | 5.11 |
| 01 - 10 | 7 | 0.30 | 7 | 0.30 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව **1:4**

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා-: 31 -40 පන්ති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2329 අතුරෙන් 31 - 40 අතර ලකුණු ලබා ගත් සංඛ්‍යාව 579කි. එය ප්‍රතිශතයක් ලෙස 24.86කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 1011ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 43.41කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

| | |
|---|---|
| I පත්‍රය - | කාලය පැය 01යි. |
| | වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි. |

## 2.2. I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

● අංක **1** සිට **15** දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

**1.** ශ්‍රී ලංකාවේ තොරතුරු ඇතුළත් 'භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය' (Geograghia) නම් ග්‍රන්ථය රචනා කළේ කවු ද?
(1) ඇරිස්ටෝටල් (2) ප්ලිනි (3) ටොලමි (4) කොස්මස්

**2.** මහාවංසය ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ කෘතියක් ලෙස සැලකීමට තුඩු දී ඇති ප්‍රධානතම සාධකය වන්නේ,
(1) බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා රජවරුන් ගත් ප්‍රතිපත්ති විග්‍රහ වන නිසයි.
(2) රටේ නීතිය හා සාමය රැක ගැනීමට පාලකයන් ගත් ප්‍රතිපත්ති විස්තර කරන නිසයි.
(3) මහජන සුභසාධනය සඳහා රජවරුන් ගත් ක්‍රියාමාර්ග සඳහන් වන නිසයි.
(4) ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය ලියවී ඇති එකම මූලාශ්‍රය වන නිසයි.

**3.** විශාල ගල් පර්වත මත ලියා ඇති ලිපි,
(1) ලෙන් ලිපි ය. (2) ගිරි ලිපි ය. (3) ටැම් ලිපි ය. (4) ආසන ලිපි ය.

**4.** මෞර්ය වංශයට එරෙහිව ලම්බකර්ණ වංශිකයන් පළමුවරට නැගී සිටින්නේ කුමන රජුගේ කාලයේ දී ද?
(1) ඉලනාග (2) පළමුවන මුගලන්
(3) මානවම්ම (4) පස්වන මිහිඳු

**5.** පළමුවන විජයබාහු රජු, රජ වීමට පෙර හැඳින්වූයේ කවර නමකින් ද?
(1) සපුමල් (2) අස්ථාන (3) කිත්ති (4) තිස්ස

**6.** මෙරට චෝළ පාලනය යටතේ වැදගත් වූ ප්‍රධාන වරායක් වන්නේ මින් කුමක් ද?
(1) ගොඩවාය (2) ගෝඨපබ්බත
(3) දේවනගර (4) ගෝකණ්ණ

**7.** දළදා වහන්සේ බෙලිගල ප්‍රදේශයේ තැන්පත් කරවන ලද රජතුමා කවු ද?
(1) තුන්වන විජයබාහු (2) දෙවන පරාක්‍රමබාහු
(3) පළමුවන බුවනෙකබාහු (4) සිව්වන පරාක්‍රමබාහු

**8.** ශ්‍රී ලංකාවෙන් හමු වූ VOC ලාංඡනය සහිත කාසි අයත් වූයේ කුමන ජාතියකට ද?
(1) අරාබි (2) පෘතුගීසි (3) ලන්දේසි (4) ඉංග්‍රීසි

**9.** අඩ තැනිතලා කලාපයට අයත් ශේෂ කන්දක් වන්නේ,
(1) නමුණුකුල ය. (2) රිටිගල ය. (3) සමනල කන්ද ය. (4) කිරිගල්පොත්ත ය.

**10.** ඉබ්බන්කටුව සුසාන භූමියට ආසන්නතම නගරය පහත පිළිතුරු අතුරින් කුමක් ද?
(1) අනුරාධපුරය (2) සීගිරිය (3) දඹුල්ල (4) කුරුණෑගල

**11.** අනුරාධග්‍රාමය අංග සම්පූර්ණ අගනගරයක් බවට පත් කළ පාලකයා කවු ද?
(1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස
(3) දුටුගැමුණු (4) එළාර

**12.** පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය වූ බතාවියාව පිහිටි දූපත කුමක් ද?
(1) ෆෝර්මෝසා (2) ජාවා (3) සුමාත්‍රා (4) බෝර්නියෝ

13. නගර රාජ්‍යවල පාලනය 'පුරවැසි සභාවක්' මගින් මෙහෙය වූ රට කුමක් ද?
(1) ග්‍රීසිය (2) රෝමය (3) බුරුමය (4) කොරියාව

14. ශ්‍රී ලංකාවට රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රමය යටතේ ද?
(1) කෝල්බෲක් (2) මැකලම් (3) ඩොනමෝර් (4) සෝල්බරි

15. 'දයිබුත්සු' නමින් හැඳින්වූ බුද්ධ ප්‍රතිමාව පිහිටි රට කුමක් ද?
(1) දකුණු කොරියාව (2) ඉන්දුනීසියාව (3) චීනය (4) ජපානය

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා වරණ හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් වරණයක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමග නොගැළපේ. එම නොගැළපෙන වරණය තෝරන්න.

16. (1) ඌරාතොට (2) ගොඩවාය (3) දඹසතොට (4) ගෝකණ්ණ

17. (1) හතරැස් කොටුව (2) බිසෝ කොටුව (3) පිටවාන (4) සොරොව්ව

18. (1) වීරසුන්දර බණ්ඩාර (2) යමසිංහ බණ්ඩාර
(3) මද්දුම බණ්ඩාර (4) කොනප්පු බණ්ඩාර

19. (1) සීගිරිය (2) දඹදෙණිය (3) යාපහුව (4) කුරුණෑගල

20. (1) හංස සංදේශය (2) තිසර සංදේශය (3) පරවි සංදේශය (4) ගිරා සංදේශය

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) ශාක්‍යය - කපිලවස්තු (2) කෝලිය - රාමගාම
(3) ලිච්ඡවී - මිථිලා (4) මෝරිය - පිප්ඵලී වනය

22. (1) ඩේරියස් - පර්සියාව (2) පෙරික්ලීස් - ග්‍රීසිය
(3) ජූලියස් සීසර් - රෝමය (4) පෙක්චේ - ජපානය

23. (1) පණ්ඩුකාභය - අභය වැව (2) දේවානම්පියතිස්ස - තිසා වැව
(3) වසභ - හුරුළු වැව (4) ධාතුසේන - කලා වැව

24. (1) පණ්ඩුකාභය - භද්දකච්චානා දේවිය
(2) සද්ධාතිස්ස - විහාරමහා දේවිය
(3) මහාවිජයබාහු - ලෝකිතා දේවිය
(4) මහා පරාක්‍රමබාහු- රත්නාවලි දේවිය

25. (1) කව්සිළුමිණ - දෙවන පරාක්‍රමබාහු
(2) ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි
(3) කාව්‍යශේඛරය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(4) ලෝවැඩ සඟරාව - විල්ගම්මුල හිමි

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (*A*), (*B*), (*C*) හා (*D*) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

(*A*) සහ (*B*) පමණක් නිවැරදි නම්, අංක **1** ද,

(*B*) සහ (*C*) පමණක් නිවැරදි නම්, අංක **2** ද,

(*C*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **3** ද,

(*A*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **4** ද,

සලකුණු කරන්න.

**26.** මහින්දාගමනයට පෙර මෙරට වැසියන් බුදු දහම පිළිබඳව දැන සිටි බව තහවුරු වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශවලින් ද?

(*A*) – ථූපාරාමය දාගැබ ඉදිකර තිබීම
(*B*) – භද්දකච්චානා ඇතුලු පිරිස බෞද්ධ පිරිසක් වීම
(*C*) – සුමන සමන් දෙවියන් බුදුන් වහන්සේගේ කේශධාතු ලබාගෙන මහියංගණ දාගැබ තුළ තැන්පත් කර තිබීම
(*D*) – අරිට්ඨ කුමරු පැවිදි වීම

**27.** මහසෙන් රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?

(*A*) – ජේතවන චෛත්‍යය ඉදිකිරීම
(*B*) – බැමිණිතියා සාගතයක් ඇති වීම
(*C*) – ගිරිතලේ වැව ඉදිකිරීම
(*D*) – පබ්බතන්ත නමින් ඇළක් තැනවීම

**28.** පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?

(*A*) – හැටදාගෙය ඉදිකිරීම
(*B*) – පොළොන්නරු දළදා මැදුරේ ආරක්ෂාව වේලෙක්කාර හමුදාවට පැවරීම
(*C*) – දැදිගම කොටවෙහෙර දාගැබ කරවීම
(*D*) – දිඹුලාගල මහා කාශ්‍යප මාහිමියන්ගේ මූලිකත්වයෙන් සංඝ සංශෝධනයක් කර වීම

**29.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(*A*) – රෙපරමාදු ආගම හඳුන්වා දීම
(*B*) – යාපනයේ පැවති තේසවලමෙ නීති ක්‍රමය යාවත්කාලීන කිරීම
(*C*) – 1580 දී තැගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසින්ට පවරා දීම
(*D*) – පළමුවන විමලධර්මසූරිය රජු විසින් 1594 දී දන්තුරේ සටනින් පෘතුගීසින් පරාජයට පත් කිරීම

**30.** කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(*A*) – රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(*B*) – රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
(*C*) – සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දීම
(*D*) – විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම

- **අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් *X* හා *Y* තීරුවල දී ඇත. *Y* තීරුවේ ඇති නාම/ප්‍රකාශන *X* තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. *Y* තීරුවේ ඒවා *X* තීරුවේ අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

**31.**

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | මහිසමණ්ඩලය | *A* | – මහා රක්ඛිත තෙර |
| (2) | ස්වර්ණ භූමිය | *B* | – මහා දේව තෙර |
| (3) | යෝනක දේශය | *C* | – මජ්ඣිම තෙර |
| (4) | හිමවන්ත ප්‍රදේශය | *D* | – සෝණ හා උත්තර තෙරවරු |

(1) *A, C, B, D* (2) *B, D, A, C* (3) *C, D, A, B* (4) *D, A, B, C*

**32.**

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | දඹදෙණිය | *A* | – හතරවන බුවනෙකබාහු රජු |
| (2) | යාපහුව | *B* | – හයවන පරාක්‍රමබාහු රජු |
| (3) | ගම්පොළ | *C* | – තුන්වන විජයබාහු රජු |
| (4) | කෝට්ටේ | *D* | – පළමුවන බුවනෙකබාහු රජු |

(1) *B, C, D, A* (2) *C, D, A, B* (3) *D, C, A, B* (4) *B, A, D, C*

**33.** X | Y

(1) පේසකාර ගාම — A – කුඹල් කර්මාන්තය
(2) වඩ්ඩකි ගාම — B – මැණික් කර්මාන්තය
(3) මණිකාර ගාම — C – රෙදි නිෂ්පාදනය
(4) කුම්භකාර ගාම — D – වඩු කර්මාන්තය

(1) *D, A, B, C* (2) *B, A, C, D* (3) *C, D, A, B* (4) *C, D, B, A*

**34.** X | Y

(1) බුරුමය — A – මීරුක්සා විහාරය
(2) සියම (තායිලන්තය) — B – පාචීන්පුරි විහාරය
(3) කාම්බෝජය — C – ස්වේදගොන් චෛත්‍යය
(4) කොරියාව — D – අන්කෝර් වට් විහාරය

(1) *D, C, A, B* (2) *C, B, A, D* (3) *C, B, D, A* (4) *A, C, D, B*

**35.** X | Y

(1) ෆෙඩ්රික් නෝර්ත් — A – සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දීම
(2) තෝමස් මේට්ලන්ඩ් — B – ශ්‍රේෂ්ඨාධිකරණ පිහිටුවීම
(3) හෙන්රි රොබට් බ්‍රවුන්රිග් — C – ජූරි සභා ක්‍රමය හඳුන්වා දීම
(4) හෙන්රි මැකලම් — D – උඩරට ගිවිසුම අත්සන් කිරීම

(1) *B, C, D, A* (2) *B, D, C, A* (3) *B, A, C, D* (4) *C, B, A, D*

- අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ.

ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා, එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | නිවැරදි ය. |
| 4 | වැරදි ය. | වැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **36.** | විජය කුමරුගේ ඇමතිවරු උදේනිගාම, දීඝගාම, කාජරගාම ආදී ජනාවාස පිහිටුවා ගත්හ. | සිංහල ශිෂ්ටාචාරයේ තොටිල්ල යනුවෙන් හඳුන්වන්නේ රජරට වියළි කලාපයයි. |
| **37.** | භණ්ඩුක උපාසක, චේදිස දේවියගේ නැගණියගේ පුත්‍රයා ය. | ශ්‍රී ලාංකික පළමු භික්ෂුව අරිට්ඨ කුමාරයා ය. |
| **38.** | පළමුවන විජයබාහු කාලිංග මාඝගෙන් පොළොන්නරුව නිදහස් කර ගත්තේ ය. | පළමුවන පරාක්‍රමබාහු රජු කව්සිළුමිණ රචනා කළේය. |
| **39.** | ලන්දේසීහු මුහුදුබඩ ප්‍රදේශය කොමාන්ඩරි කුනකට බෙදා පාලනය කළහ. | ලන්දේසීන් යටතේ කතෝලික ආගමිකයන්ට මුදලි මුහන්දිරම් වැනි තනතුරු ලබා දෙනු ලැබී ය. |
| **40.** | පෙරික්ලීස් පාලන සමය ග්‍රීක ශිෂ්ටාරයේ ස්වර්ණමය යුගයයි. | ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණවලින් පසු ග්‍රීක සංස්කෘතිය 'හෙලනිස්ටික්' සංස්කෘතිය වශයෙන් හඳුන්වනු ලැබේ. |

* *

## 2.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 21. | 3 |
| 02. | 4 | 22. | 4 |
| 03. | 2 | 23. | 3 |
| 04. | 1 | 24. | 1 |
| 05. | 3 | 25. | 4 |
| 06. | 4 | 26. | 2 |
| 07. | 1 | 27. | 4 |
| 08. | 3 | 28. | 3 |
| 09. | 2 | 29. | 3 |
| 10. | 3 | 30. | 1 |
| 11. | 1 | 31. | 2 |
| 12. | 2 | 32. | 2 |
| 13. | 1 | 33. | 4 |
| 14. | 3 | 34. | 3 |
| 15. | 4 | 35. | 1 |
| 16. | 3 | 36. | 3 |
| 17. | 1 | 37. | 1 |
| 18. | 3 | 38. | 4 |
| 19. | 1 | 39. | 2 |
| 20. | 2 | 40. | 1 |

වගුව **2.1**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**කි.

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 2.1 (RD/16/05/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් අතුරෙන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර ලබා දී ඇති 2 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.86කි. එනම් 2 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 86%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 86%කි.

## **2.5**. I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | ප්‍රතිචාර නොදැක්වූ |
| 1 | 3 | 28.37 | 9.49 | **55.35** | 6.33 | 0.47 |
| 2 | 4 | 5.49 | 4.93 | 3.07 | **86.33** | 0.19 |
| 3 | 2 | **8.93** | **77.95** | 10.33 | 2.42 | 0.37 |
| 4 | 1 | **23.44** | 14.79 | 43.72 | 17.58 | 0.47 |
| 5 | 3 | 25.02 | 4.47 | **64.56** | 5.77 | 0.19 |
| 6 | 4 | 9.49 | 8.19 | 7.16 | **74.88** | 0.28 |
| 7 | 1 | **36.93** | 24.19 | 27.16 | 11.16 | 0.56 |
| 8 | 3 | 7.53 | 21.67 | **55.07** | 15.44 | 0.28 |
| 9 | 2 | 14.7 | **47.44** | 11.44 | 26.23 | 0.19 |
| 10 | 3 | 23.63 | 10.42 | **40.56** | 25.21 | 0.19 |
| 11 | 1 | **67.81** | 7.63 | 21.86 | 2.51 | 0.19 |
| 12 | 2 | 9.77 | 43.63 | 36.19 | 10.05 | 0.37 |
| 13 | 1 | **37.49** | 36.28 | 18.23 | 7.72 | 0.28 |
| 14 | 3 | 24.93 | 14.33 | **34.7** | 25.95 | 0.09 |
| 15 | 4 | 18.42 | 21.49 | 32.56 | **27.44** | 0.09 |
| 16 | 3 | 13.86 | 14.7 | **45.3** | 26.05 | 0.09 |
| 17 | 1 | **70.7** | 10.33 | 10.6 | 8.28 | 0.09 |
| 18 | 3 | 21.02 | 23.63 | **45.95** | 9.21 | 0.19 |
| 19 | 1 | **66.51** | 11.72 | 6.98 | 14.42 | 0.37 |
| 20 | 2 | 11.26 | **64** | 12.28 | 11.91 | 0.56 |
| 21 | 3 | 5.58 | 25.86 | **30.88** | 37.4 | 0.28 |
| 22 | 4 | 22.33 | 24.19 | 11.26 | **42.05** | 0.19 |
| 23 | 3 | 14.7 | 18.88 | **58.14** | 8.19 | 0.09 |
| 24 | 1 | **30.14** | 36.65 | 18.14 | 14.98 | 0.09 |
| 25 | 4 | 7.63 | 5.67 | 4.74 | **81.77** | 0.19 |
| 26 | 2 | 9.49 | **67.07** | 13.58 | 9.86 | 0 |
| 27 | 4 | 14.05 | 16.28 | 35.81 | **33.86** | 0 |
| 28 | 3 | 20.19 | 17.95 | **29.02** | 32.84 | 0 |
| 29 | 3 | 21.02 | 13.21 | **36.84** | 28.84 | 0.09 |
| 30 | 1 | **27.07** | 19.53 | 28.19 | 25.02 | 0.19 |
| 31 | 2 | 16.84 | **38.6** | 32.84 | 11.26 | 0.47 |
| 32 | 2 | 13.3 | **46.42** | 26.23 | 14.05 | 0 |
| 33 | 4 | 4.28 | 6.51 | 10.33 | **78.88** | 0 |
| 34 | 3 | 18.7 | 28.84 | **37.4** | 14.79 | 0.28 |
| 35 | 1 | **36.74** | 24 | 22.23 | 16.93 | 0.09 |
| 36 | 3 | 32.84 | 32.84 | **25.4** | 8.93 | 0 |
| 37 | 1 | **57.12** | 10.98 | 25.67 | 6.05 | 0.19 |
| 38 | 4 | 18.51 | 36.84 | 21.77 | **22.79** | 0.09 |
| 39 | 2 | 28.19 | **29.12** | 23.81 | 18.88 | 0 |
| 40 | 1 | **22.7** | 19.81 | 22.98 | 34.23 | 0.28 |

වගුව 2.2

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

* "ප්‍රතිචාර නොදැක්වූ" යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා කිසිදු වරණ ගත් තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

## 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා/ විෂය ක්ෂේත්‍ර 06කි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.

| තේමා/ විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| ඓතිහාසික මූලාශ්‍රය | 1, 2, 3 |
| ශ්‍රී ලංකා ඉතිහාසය : රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා | 4, 5, 6, 9, 10 ,11, 16, 17, 23, 24, 26, 27, 28, 33 36, 37, 38 |
| ශ්‍රී ලංකා ඉතිහාසය : පසුකාලීන රාජධානි | 7, 18, 19, 20, 25, 32 |
| ශ්‍රී ලංකාව සහ බටහිර ජාතීන් | 8, 12, 14, 29, 30, 35, 39 |
| ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා | 13, 21, 22, 40 |
| ආසියාතික රටවල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය | 15, 31, 34 |

වගුව **2.3**

1 ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විතය. 1 ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා සංඛ්‍යාව 6කි. ඒ ඒ තේමාවට අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය 2.3 වගුව මගින් නිරූපණය වේ. ඒ අනුව ඓතිහාසික මූලාශ්‍රය තේමාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 03කි. එය I පත්‍රයට අදාළව 7.5%ක බර තැබීමකි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා තේමාව යටතේ ප්‍රශ්න 17ක් සකස් වී ඇත. එය මෙම ප්‍රශ්න පත්‍රයෙහි 42.5%ක බර තැබීමක් වේ. තුන්වන තේමාව වූ පසුකාලීන රාජධානි යටතේ ප්‍රශ්න 6ක් වෙන් කර ඇති අතර එය 15%ක බර තැබීමකි. 4වන තේමාව වූ ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් යන මාතෘකාවට අදාළව ප්‍රශ්න 7ක් ඇති අතර එය 17.5%ක බර තැබීමක් වේ. පස්වන තේමාව වූ ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා සඳහා ප්‍රශ්න 4කි. එය 10%ක බර තැබීමකි. අවසාන තේමාව වූ ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය යටතේ ප්‍රශ්න 3ක් සකස් කර ඇත. එය 7.5%ක බර තැබීමක් වේ. මෙම බර තැබීම විෂය නිර්දේශයේ ඒ ඒ තේමාවලට වෙන් කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව අනුව සිදු කර ඇත.


මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020
07 - ඉතිහාසය - I පත්‍රය
ප්‍රශ්නවල පහසුතා දර්ශක
පහසුතා දර්ශකය
ප්‍රශ්න අංකය
ඓතිහාසික මූලාශ්‍ර
ශ්‍රී ලංකා ඉතිහාසය : රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා
ශ්‍රී ලංකාව සහ බටහිර ජාතීන්
ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා
ආසියාතික රටවල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය

ප්‍රස්තාරය 2.2

ඓතිහාසික මූලාශ්‍රය තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න 03 අතුරෙන් පහසුතාව වැඩිම දෙවන ප්‍රශ්නයෙහි පහසුතාව 86%කි. එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇති අනෙක් ප්‍රශ්න දෙක සඳහා ද පහසුතාව 55%ක් හෝ ඊට වැඩි අගයකි. ශ්‍රී ලංකා ඉතිහාසය : රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා තේමාවට අදාළ ප්‍රශ්න 17 න් පහසුතාව වැඩිම 33 ප්‍රශ්නයෙහි පහසුතාව 79%කි. මෙම ප්‍රශ්න 17 න් 8 ක් සඳහා පහසුතාව 55%කට වැඩි වේ. ප්‍රශ්න ක් සඳහා පහසුතාව 35%කට අඩු අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකා ඉතිහාසය : පසුකාලීන රාජධානි තේමාවට අදාළ ප්‍රශ්න 6ම සඳහා පහසුතාව 35%කට වැඩි වේ. ශ්‍රී ලංකාව සහ බටහිර ජාතීන් යන තේමාව යටතේ ඇති ප්‍රශ්න 7න් ප්‍රශ්න දෙකක් සඳහා පහසුතාව 30%ට අඩු අගයක් ගෙන ඇත. ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා තේමාවට අදාළව ප්‍රශ්න 4න් පහසුතාව අඩුම 40 ප්‍රශ්නයෙහි පහසුතාව 23%ක් වේ. ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය තේමාවට අදාළව ප්‍රශ්න සංඛ්‍යාව 03කි. එම ප්‍රශ්න සඳහා පහසුතාව 40%ට අඩු අගයකි.




**ප්‍රස්තාරය 2.3**

ඉතිහාසය 1 ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 6 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව හා එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඓතිහාසික මූලාශ්‍රය යටතේ අවම ප්‍රශ්න ප්‍රතිශතයක් ඉදිරිපත් වී තිබුණ ද එම තේමාවෙහි පහසුතාව 73%කි. එය මෙම තේමා 6 අතුරෙන් පහසුතාව වැඩිම තේමාව වේ.

| විෂය ක්ෂේත්‍රය | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|---|---|
| ඓතිහාසික මූලාශ්‍රය | (2) 86% | (1) 55% | 73% |
| ශ්‍රී ලංකා ඉතිහාසය : රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා | (33) 79% | (4), (38) 23% | 49% |
| ශ්‍රී ලංකා ඉතිහාසය : පසුකාලීන රාජධානි | (25) 82% | (7) 37% | 57% |
| ශ්‍රී ලංකාව සහ බටහිර ජාතීන් | (8) 55% | (30) 27% | 38% |
| ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා | (22) 42% | (40) 23% | 33% |
| ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය | (31) 39% | (15) 27% | 34% |

වගුව 2.4

## 2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- ඉතිහාසය I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. මෙම ප්‍රශ්න පත්‍රය මගින් ඉතිහාසය විෂය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම, ආකල්ප, කුසලතා, සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.

- මෙම බහුවරණ පත්‍රය සැකසීමේ දී 1, 2 හා 3 යන ප්‍රශ්න ඓතිහාසික මූලාශ්‍රය නම් තේමාව අනුව සකස් වී ඇත. එම කොටසේ ප්‍රශ්නවල සමස්ත පහසුතාව 73%කි. මෙම ප්‍රශ්න 03 අතුරෙන් පහසුතාව වැඩිම 2 ප්‍රශ්නයෙහි පහසුතාව 86%කි. I පත්‍රයේ පහසුම ප්‍රශ්නය වී ඇත්තේ එයයි. මූලාශ්‍රය පිළිබඳ ඉගැන්වීමේ දී මහාවංශය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බැවින් අපේක්ෂකයන්ට මෙම ප්‍රශ්නය වඩාත් පහසු වී ඇත.

- පළමු තේමාව යටතේ පහසුතාව අඩුම 1 ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි. මූලාශ්‍රය අතුරෙන් විදේශීය ලේඛන පිළිබඳ අවබෝධය තරමක් අඩු බැවින් මෙම ප්‍රශ්නයෙහි පහසුතාව අඩු මට්ටමක පවතී. දැනුම ලබාදීමේ දී මෙම අතුරෙන් ක්ෂේත්‍රය පිළිබඳ වැඩි අවධානයක් ලබාදිය යුතු ය.

- I පත්‍රයේ ඇති ප්‍රශ්න අතුරෙන් වැඩි ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් වන්නේ දෙවන තේමාවටයි. එම තේමාව යටතේ ප්‍රශ්න 17කි. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම 33 ප්‍රශ්නයෙහි පහසුතාව 79%කි. පහසුතාව අඩුම ප්‍රශ්නය වී ඇති 4 හා 38 ප්‍රශ්නවල පහසුතාව 23%කි. වරණයන්හි අන්තර්ගතය නියමාකාරයෙන් අවබෝධ කර නොගැනීම අඩු පහසුතාවට හේතු වී ඇති බව පෙන්වා දිය හැකිය. වරණයන්හි අන්තර්ගතය මෙන්ම නිවැරදි වරණ තෝරා ගැනීම සම්බන්ධයෙන් දී ඇති උපදෙස් මනා ලෙස අවබෝධ කර ගැනීමට අපේක්ෂකයන් පුහුණු කළ යුතු ය.

- 3 තේමාව යටතේ අදාළ ක්ෂේත්‍රයට ප්‍රශ්න 6ක් ඇතුලත් වේ. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම 25 ප්‍රශ්නයෙහි පහසුතාව 82%කි. පහසුතාව අඩුම 7 ප්‍රශ්නයෙහි පහසුතාව 37%කි. 25 ප්‍රශ්නයට අදාළ ක්ෂේත්‍රය පිළිබඳව දැනුම වෙනත් විෂයයන්ගෙන්ද ආවරණය වීම ඉහළ සාධනයට හේතු වී තිබිය හැක. 7 ප්‍රශ්නයේ අඩු පහසුතාවට එම ප්‍රශ්නය තරමක් දුරට හුදකලා සිද්ධියක් පිළිබඳ විමසා තිබීම හේතුවිය හැකිය. එබැවින් හුදකලා සිදුවීම් වුව ද ඓතිහාසික වටිනාකමක් ඇති බැවින් එවැනි සිද්ධින් පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

- 4 තේමාව යටතේ ප්‍රශ්න 5ක් අඩංගු වේ. මේවා අතුරෙන් පහසුතාව වැඩිම 8 ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි. මෙම ප්‍රශ්නයට අදාළ ලාංඡනය ගැන ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දෘශ්‍ය මාධ්‍ය මගින් වැඩි අවබෝධයක් ලබා දීම වැඩි පහසුතාවට හේතු වී තිබිය හැකිය. මෙම තේමාව යටතේ පහසුතාව අඩුම 30 ප්‍රශ්නයෙහි පහසුතාව 27%කි. බ්‍රිතාන්‍ය සමයේ ක්‍රියාත්මක වූ විවිධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැති වීම අඩු පහසුතාවට හේතු වී තිබිය හැකිය. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- 5 තේමාවට අදාළව ප්‍රශ්න 4ක් ඇතුලත් වේ. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 22 ප්‍රශ්නයෙහි පහසුතාව 42%කි. පහසුතාව අඩුම 40 ප්‍රශ්නයෙහි පහසුතාව 23%කි.

- 6 තේමාවට අදාළව ප්‍රශ්න 3ක් ඇතුළත් ය. එහි පහසුතාව වැඩිම 31 ප්‍රශ්නයෙහි පහසුතාව 39%කි. එම තේමාව යටතේ පහසුතාව අඩුම 15 ප්‍රශ්නයෙහි එහි පහසුතාව 27%කි. පොදුවේ ගත්විට 5 හා 6 තේමා යටතේ අපේක්ෂකයන් දක්වා ඇති ප්‍රතිචාර සාධනීය මට්ටමක නොපවතී. ඊට හේතු වී ඇත්තේ ලෝක ශිෂ්ටාචාරයේ විකාශය හා ප්‍රවණතා මෙන්ම ආසියාතික රටවල බෞද්ධ සංස්කෘතිය කෙරෙහි ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීම ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම තේමාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණ

# 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

## 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න හතෙන් හතරකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් මුළු ලකුණු 60කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | | | |
|---|---|---|---|---|
| I | පත්‍රය | සඳහා ලකුණු | = | 40 |
| II | පත්‍රය | සඳහා ලකුණු | = | 60 |
| අවසාන ලකුණ | | | = | 100 |

ඉතිහාසය I සහ II පත්‍ර සඳහා නියමිත කාලය පැය 03කි.

## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




පළමු වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. සෙසු ප්‍රශ්න අතුරින් වැඩිම අපේක්ෂකයන් පිරිසක් (92%)පිළිතුරු සපයා ඇත්තේ 3 වන ප්‍රශ්නයට වන අතර අඩුම අපේක්ෂකයන් පිරිසක් (6%) පිළිතුරු සපයා ඇත්තේ 7 ප්‍රශ්නයට ය.

3 ප්‍රශ්නය වැඩි පිරිසක් තෝරා ගැනීමට හේතු වී ඇත්තේ එයට අදාළ විෂය කොටස් සිසුන් විසින් නිරන්තරයෙන්ම අධ්‍යයනය කරනු ලැබීමයි.

7 ප්‍රශ්නය අඩු පිරිසක් විසින් තෝරා ගැනීමට හේතුව විය හැක්කේ එයට අදාළ මාතෘකා සිසුන්ට තරමක් ආගන්තුක වීම යි.

ප්‍රස්තාරය 3.1 (RD/16/02/FMP පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදාහරණය - මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය 12කි. අපේක්ෂකයන් 39%ක පිරිසක් ලකුණු 00 - 03 අතර ලකුණු ලබාගෙන ඇත. අපේක්ෂකයන් 40%ක පිරිසක් ලකුණු 4 - 6 අතර ලබාගෙන ඇති අතර අපේක්ෂකයන් 17%ක පිරිසක් ලකුණු 7 -9 අතර ලබාගෙන ඇත. ලකුණු 10 - 12 අතර ලබාගත් පිරිස 4%කි.

ප්‍රස්තාරය 3.2

## 3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 3.3 (RD/16/04/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 3(i)(අ) කොටසෙහි පහසුතා දර්ශකය 0.96කි. එනම් 3(i)(අ) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 96%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 96%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 1(iii)(ආ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.03කි. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 3%කි.

## 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**"ආ" උප කොටස**

01 ප්‍රශ්නය

**1.** **(i)** ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

**(ඇමුණුම 01)**

1. කලා ඔය
2. යාපනය
3. කොළඹ
4. පොළොන්නරුව
5. කාජරගාම
6. මහියංගණය

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

- පහත දී ඇති **A** හා **B** රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** (අ) **A** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(ඉ) මෙය ඉදිකරවන ලද්දේ කවුරුන් ද?

**A**



*(ලකුණු 03 යි)*

**(iii)** (අ) **B** රූපයෙන් දැක්වෙන ප්‍රතිමාව නම් කරන්න.
(ආ) මෙම ප්‍රතිමාව නිර්මාණය කරන ලද්දේ කවුද?
(ඉ) මෙම ප්‍රතිමාව පිහිටි දේවස්ථානය නම් කරන්න.

**B**



*(ලකුණු 03 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i) සිතියම බලන්න (නිවැරදි ලකුණු කිරීමට ලකුණු 01 බැගිනි) **(1 × 6)**

(ලකුණු **06**යි)

(ii) (අ) කුට්ටම් පොකුණ
(ආ) අනුරාධපුරය
(ඉ) පළමුවන අග්බෝ රජු (ලකුණු **03**යි)

(iii) (අ) ඇතීනා දෙවඟන
(ආ) ෆීඩියස්
(ඉ) පාතීනන් දේවස්ථානය (ලකුණු **03**යි)

## 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




01 ප්‍රශ්නය අනිවාර්ය වේ. අංක 3.4 ප්‍රස්තාරයට අනුව පිළිතුරු සැපයූ අපේක්ෂක ප්‍රතිශතය 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 04%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 4%ක් වන අතර 39% ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අනුකොටස් 7ක් ඇති අතර ඉන් 50%කට වැඩි පහසුතාව සහිත කොටස් 3කි. මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාවක් සහිත (ii) කොටසේ (අ) කොටසෙහි පහසුතාව 90%ක් වේ. අඩුම පහසුතාව (iii) කොටසේ (ආ) අනුකොටසෙහි පහසුතාව 3%කි.

- පළමු ප්‍රශ්නයේ (i) කොටස ශ්‍රී ලංකාවේ සිතියම ලකුණු කිරීම හා සම්බන්ධ වේ. එහි පහසුතාව 31%කි. එහි පැරණි ඓතිහාසික ස්ථාන නම් කර ලකුණු කිරීම අපේක්ෂකයන්ට පහසු වී ඇත.
- පළමු ප්‍රශ්නයේ (ii) කොටසේ (අ), (ආ) හා (ඉ) අනුකොටස් සඳහා රූපය හා පිහිටි ඓතිහාසික නගරය පිළිබඳ විමසීම් පිළිවෙළින් 90% 71% හා 20% යන පහසුතා මට්ටම්වල පවතී. අඩුම සාධනය දක්වා ඇත්තේ එය ඉදිකළ රජු සම්බන්ධයෙනි.
- (ii) කොටසේ (අ) හා (ආ) කොටස්වල ශිෂ්‍ය සාධනය ඉහළ අගයක් ගෙන ඇත්තේ විවිධ ශ්‍රේණිවලින් ලබා ගත් දැනුම පිළිබඳ මතක ශක්තිය තුලින් විය හැකිය.
- (ii) කොටසේ (ඉ) පහසුතාව අඩු මට්ටමක පවතින බැවින් රජවරු සම්බන්ධ ඇනුම ලබා දීමට ගුරුවරුන්ගේ මැදිහත් වීම අවැසි බව පෙන්වා දිය හැකිය.
- මෙවැනි ප්‍රශ්නවල සාධන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා විටින් විට ඓතිහාසික ස්ථාන ලකුණු කිරීම, ලකුණු කර ඇති ස්ථාන පන්තිකාමරය තුළ ප්‍රදර්ශනය කිරීම, පින්තූර පොත් පරිහරණය කිරීම හා රජවරුන්ගේ නාම ලේඛනය ප්‍රදර්ශනය කිරීම වැනි ක්‍රමවේද භාවිතා කිරීම යෝග්‍ය වේ.

## 02 ප්‍රශ්නය

**2.** (i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවීමෙහි ලා වැදගත් වූ වරාය දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉන්දියාව ආසන්නයේ පිහිටීම නිසා ශ්‍රී ලංකාවට ඇති වූ බලපෑම් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ශ්‍රී ලංකාවේ ජනාවාස බිහිවීම කෙරෙහි අභ්‍යන්තර භූ ලක්ෂණ බලපෑ අයුරු නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(2) (i)
- මහාතිත්ථ (මාතොට), ගෝකණ්ණ (ත්‍රිකුණාමලය), ඌරාතොට

(ලකුණු 02යි)

(ii)
- ඉන්දියානු රාජාභිෂේක ක්‍රමය ලංකාවට හඳුන්වා දීම
- අතීතයේ දී ශ්‍රී ලංකාවේ සේනාව ඉන්දීය සිව්රඟ සේනාව අනුව සකස් වීම
- ඉන්දියානු ක්‍රමය අනුව ගම්, නියම්ගම්, රාජධානි, නගර ගොඩනැගීම
- දකුණු ඉන්දියානු ආක්‍රමණ ඇතිවීම
- ලංකාවේ රජවරු දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම
- ඉන්දියාව සමග විවාහ, පරිපාලන හා යුද සබඳතා
- ඉන්දියානු ආගමික, ඇදහිලි හා විශ්වාස සබඳතා ඇතිවීම
- ඉන්දියානු සංස්කෘතික ආභාසය

(කරුණු 02ට ලකුණු 04යි)

(iii)
- ගංගා ආශ්‍රිතව ජනාවාස බිහිවීම
- තැනිතලා ආශ්‍රිතව ජනාවාස බිහිවීම
- සම්පත් ආශ්‍රිතව ජනාවාස බිහිවීම

(කරුණු 02ට ලකුණු 02යි විස්තරයට ලකුණු 04යි)
(ලකුණු 06යි)

## 02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




අංක 3.4 ප්‍රස්තාරය අනුව 02 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 89%කි . මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලකුණු 12ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 35%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 34%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගෙන ඇති පිරිස 11%ක් වන අතර 20%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් තුන (3) අතුරෙන් පහසුතාව වැඩිම (ii) කොටසෙහි පහසුතාව 71%කි. එසේම පහසුතාව අඩුම (iii) කොටසෙහි පහසුතාව 28%කි.

- ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවීම ඉන්දීය උප මහද්වීපයට ආසන්නව පිහිටීම හා අභ්‍යන්තර භූ ලක්ෂණ පැරණි ඉතිහාසය සකස්වීමට බලපෑ ආකාරය පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 89%කි.

- මෙම ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් සඳහා පහසුතාව 70%ක් හෝ ඊට වඩා වැඩි වේ. සමස්ත ප්‍රශ්නයේ (i) (ii) (iii) කොටස් සඳහා පිළිවෙලින් පහසුතාව 70%, 71% හා 28% වේ. ශිෂ්‍ය සාධනය යම් තරමක් ඉහළ වීම කෙරෙහි 3 හා 4 ශ්‍රේණිවල දී එම කරුණු පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමට අවකාශය සැලසීම හේතුවන්නට ඇත. (iii) කොටස 28%ක පහසුතාවට එම ප්‍රශ්නය වටහා ගැනීමේ අපහසුතා හේතු වන්නට ඇත.

- (i) වන හා (ii) කොටස් සඳහා වගුගත කිරීම සහ යා කිරීමේ වර්ගයේ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම වැඩි දියුණු කිරීමෙන් සාධන මට්ටම ඉහළ නංවාගත හැකිවනු ඇත. පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීම හා භූ සිතියම් අධ්‍යයනය ඇසුරින් පිළිතුරු සැපයීමට සැලැස්වීම තුළින් ඉහළ දැනුමක් ඇති කර දීමට හැකි වේ.

03 ප්‍රශ්නය

**3.** "මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොවේ. හුදෙක් සම්බුද්ධ සසුනේ චිරස්ථිතිය සඳහා ය."

(i) (අ) මේ පාඨය හා සම්බන්ධ රජතුමාගේ නම

(ආ) ඔහුගේ පියාගේ නම

(ඉ) ඔහුගේ මවගේ නම

(ඊ) ඔහුගේ සහෝදරයාගේ නම

පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) මෙම රජතුමාගෙන් ඉටු වූ ශාසනික සේවා දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(iii) වළගම්බා රාජ්‍ය සමයේ සිදු වූ වැදගත් ආගමික සේවා දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(3) (i) (අ) දුටුගැමුණු රජතුමා

(ආ) කාවන්තිස්ස රජතුමා

(ඉ) විහාරමහා දේවිය

(ඊ) සද්ධාතිස්ස රජතුමා **(ලකුණු 04යි)**

(ii)
- මිරිසවැටිය ඉදිකිරීම
- රුවන්වැලි සෑය ඉදිකිරීම
- ලෝවාමහාපාය ඉදිකිරීම

**(කරුණු 02ට ලකුණු 02යි)**

(iii)
- අභයගිරි විහාරය ඉදි කිරීම
- ශ්‍රී ලංකාවේ ප්‍රථම ආරාම පූජාව සිදු කිරීම
- විහාර රැසක් තනා පූජා කිරීම
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම

**(කරුණු 02ට ලකුණු 02යි විස්තරයට ලකුණු 04යි)**

**(ලකුණු 06යි)**

**03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අංක 3.4 ප්‍රස්තාරය අනුව 03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 92%කි . මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 06%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගෙන ඇති පිරිස 30%ක් වන අතර 06%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩිම (i) (අ) අනුකොටස වේ. එහි පහසුතාව 96%කි. එසේම පහසුතාව අඩුම (iii) කොටසෙහි පහසුතාව 40%කි.

- මුල් අනුරාධපුර යුගයේ රජවරු හා ඔවුන්ගේ ශාසනික සේවා පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරාගෙන ඇති ශිෂ්‍ය පිරිස 92%කි.

- මෙම ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් හා අනුකොටස් සඳහා පහසුතාව 72%ක් ඉක්මවා ඇත. සමස්ත ප්‍රශ්නයේ (i) (අ) (ආ) (ඉ) (ඊ), (ii) හා (iii) සඳහා පිළිවෙලින් පහසුතාව 96%, 91%, 93%, 93% 72% හා 40%ක් වේ. මෙවැනි පහසුතා ඇති වීම කෙරෙහි ඉතා ජනප්‍රිය මාතෘකා වීම හා 3 හා 4 ශ්‍රේණිවලදී එම මාතෘකා අධ්‍යයනය කිරීමට අවකාශ සැලසීම හේතු වන්නට ඇත. (iii) කොටසට 40%ක පහසුතාවට හේතු වන්නට ඇත්තේ කරුණු සංවිධානය කර ගැනීමේ අපහසුතාවයයි.

- කොටස් සියල්ල සඳහා වගුගත කිරීම හා යා කිරීම් වර්ගයේ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඉඩ සැලසීමෙන් සාධන මට්ටම් ඉහළ නංවා ගත හැකි වනු ඇත. (iii) කොටස සඳහා පෙරහුරු පරීක්ෂණ පැවැත්වීමට ඉඩ සැලැස්වීම තුළින් ඉහළ සාධන මට්ටමක් අත් කර දීමට පුළුවන.

## 04 ප්‍රශ්නය

**4. ක්‍රිස්තු වර්ෂ 1017 දී චෝළයෝ පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගත්හ.**

**(i) (අ) ක්‍රිස්තු වර්ෂ 1017 දී රජරට ආක්‍රමණය කළ සොළී පාලකයාගේත්,**
**(ආ) එවකට රජරට පාලනය කළ රජතුමාගේත්**
**නම් ලියන්න.** ***(ලකුණු 02 යි)***

**(ii) චෝළයින් පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට හේතු දෙකක් සඳහන් කරන්න.** ***(ලකුණු 04 යි)***

**(iii) පොළොන්නරු යුගයේ ආගමික හා ගෘහ නිර්මාණ ශිල්ප කෙරෙහි චෝළ පාලනයේ බලපෑම නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.** ***(ලකුණු 06 යි)***

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) (අ) පළමුවන රාජේන්ද්‍ර
(ආ) පස්වන මිහිඳු/ පස්වන මහින්ද **(ලකුණු 02යි)**

(ii)
- රෝහණයත් අනුරාධපුරයත් අතර ගමන් මාර්ගයේ පිහිටා තිබීම
- පොළොන්නරුව මහවැලි ගඟ ආශ්‍රිතව පිහිටි නගරයක් වීම
- චෝළ ආධිපත්‍යයට එරෙහිව රෝහණයෙන් එල්ලවිය හැකි විරෝධතා පාලනය කිරීමේ පහසුව
- කෘෂිකර්මාන්තය අතින් වැදගත් සශ්‍රීක ප්‍රදේශයක් වීම
- චෝළ අධිරාජ්‍යයට අයත් සමුද්‍රාශ්‍රිත ප්‍රදේශ පාලනය කිරීමට පහසු ගෝකණ්ණ වරාය අසල පිහිටා තිබීම

**(හේතු දෙකට ලකුණු 04යි)**

(iii)
- ශිව දේවාල ඉදිකිරීම
  පොළොන්නරුවේ අංක 01 සහ අංක 02 ශිව දේවාල
- කන්තලේ සහ මන්නාරම ප්‍රදේශවල ශිව දේවාල ඉදිකිරීම
- බෞද්ධ විහාර ස්ථාන පිළිසකර කර ඒවාට හින්දු නම් ලබාදීම
  වෙල්ගම් විහාරය, රාජරාජ පෙරුම්පල්ලි
- හින්දු ගෘහ නිර්මාණ ශිල්පය
  ථූපාරාමය
- පොළොන්නරුවේ සඳකඩපහනින් ගවයා ඉවත් කිරීම

**(ලකුණු 06යි)**

## 04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




අංක 3.4 ප්‍රස්තාරයට අනුව 04 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 64%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 41%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ට හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති සංඛ්‍යාව 10%ක් වන අතර 41%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.



- මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩිම (ii) කොටසෙහි පහසුතාව 52%කි. එසේම පහසුතාවය අඩුම (iii) කොටසෙහි පහසුතාව 17%කි.

- චෝලයන් රජරට ප්‍රදේශය අල්ලා ගැනීම හා චෝල පාලනය තුළින් මතු වූ ප්‍රවණතා පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 64%කි.

- සමස්ත ප්‍රශ්නයෙහි (i) (අ) (ආ), (ii) හා (iii) කොටස් සඳහා පහසුතාව පිළිවෙලින් 32%, 47%, 52% හා 17%ක්ද වේ. මෙවැනි පහසුතාවක් සඳහා අදාළ මාතෘකාවලට ඇති කැමැත්ත හා ඇතැම් කරුණු සංවිධානය කර ගැනීමේ අපහසුතාව හේතුවන්නට ඇති බව පෙන්වා දිය හැකිය.

- මෙවැනි ප්‍රශ්න සඳහා ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සහ පෙළපොත් පරිශීලනය සඳහා ඉඩ ප්‍රස්තා වැඩි කිරීමෙන් හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඡායාරූප, වීඩියෝ, වැනි භාවිතය තුළින් ඉහළ අවබෝධයක් ඇති කරදීමට හැකි වේ.

## 05 ප්‍රශ්නය

**5.** (i) සාහිත්‍යධරයකු වූ දෙවන පරාක්‍රමබාහු රජුට පිරිනමන ලද උපාධි නාමය නම් කරන්න. *(ලකුණු 02 යි)*
(ii) දෙවන පරාක්‍රමබාහු රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*
(iii) දෙවන පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවාව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

05. (i) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත **(ලකුණු 06යි)**

(ii)
- රජරට කාලිංස මාඝ ආධිපත්‍යයෙන් නිදහස් කර ගැනීම
- චන්ද්‍රභානුගේ පළමුවෙනි ආක්‍රමණය
- චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය **(කරුණු 02ට ලකුණු 04යි)**

(iii)
- දඹදෙණිය දළදා මාළිගාව ඉදිකිරීම එහි දළදාව තැන්පත් කිරීම හා දළදා පූජා පැවැත්වීම
- භික්ෂූන්ගේ විනය නීති සඳහා දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම
- උපසම්පදා උත්සව පැවැත්වීම
- විදේශවලින් ධර්මධර, විනයධර භික්ෂූන් වැඩම කරවීම

**(කරුණු 02ට ලකුණු 02යි විස්තරයට ලකුණු 04යි)**
**(ලකුණු 06යි)**

## 05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




අංක 3.4 ප්‍රස්තාරය අනුව 05 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 71%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලකුණු 12ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 07%ක් ද
ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 07% ක් වන අතර 42%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතරෙන් පහසුතාව වැඩිම හා අඩුම (i) හා (iii) කොටස්හි පහසුතාව පිළිවෙලින් 74%ක් හා 21%ක් වේ.

- රාජධානිය නිරිත දිගට විතැන්වූ අවදියේ දී සුවිශේෂීවූ පාලකයන් හා ඔවුන්ගේ ශාසනික කාර්යය පිළිබඳව දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 71%කි.

- රජවරුන් හා ඔවුන්ගේ සේවාවන් පිළිබඳ දැනුම වර්ධනය කිරීමට හැකි වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම ක්‍රමවේදය සකස්කර ගැනීම සුදුසු වේ.

**"ආ" උප කොටස**

## 06 ප්‍රශ්නය

**6. (i) ක්‍රිස්තු වර්ෂ 1453 ඔටෝමන් තුර්කින් විසින් යටත් කරගත් ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය නම් කරන්න.** *(ලකුණු 02 යි)*

**(ii) ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.** *(ලකුණු 04 යි)*

**(iii) ශ්‍රී ලංකාව කෙරෙහි පෘතුගීසීන්ගේ බලපෑම පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ පැහැදිලි කරන්න.**

**(අ) සමාජ හා සංස්කෘතික**

**(ආ) ආගමික** *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

06. (i) කොන්ස්තන්තිනෝපලය (ලකුණු 06යි)

(ii)
- වෙළෙඳ වාසි ලබාගැනීම
- ආගම ව්‍යාප්ත කිරීම
- මුස්ලිම්වරුන්ගෙන් වෙළෙඳ ඒකාධිකාරය (ආසියාවේ) අතපත් කර ගැනීම
- යටත් විජිත පිහිටුවා ගැනීම (කරුණු 02ට ලකුණු 04යි)

(iii) (අ)
- කතෝලික ජන සමාජයක් බිහිවීම
- පුද්ගල නාම හා වචන එකතු වීම
- ගෘහ භාණ්ඩ, ඇඳුම් පැලඳුම්, ආහාර වර්ග, සංගීතය ආදී නවාංග එකතු වීම
- අධ්‍යාපනය හා වාස්තු විද්‍යා අංග එකතු වීම

(ආ)
- රජ පවුල්වල අය කතෝලික ආගමට හරවා ගැනීම
- ජනතාව අතර කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- කතෝලික ආගම වැළඳගත් අය සඳහා වරප්‍රසාද, තනතුරු ලබාදීම
- අධ්‍යාපනය සමඟ කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- දේශීය ආගම්වල පහර වැදීම හා යටපත් වීම

(ලකුණු 06යි)

## 06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




අංක 3.4 ප්‍රස්තාරය අනුව 06 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 17%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 46%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබාගෙන ඇති පිරිස 11%ක් වන අතර 42%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) (අ) කොටස වේ. පහසුතාව අඩුම කොටස (i) කොටස වේ.
- 16 වන සියවසෙන් පසු යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිකළ බලපෑම පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරාගෙන ඇති ශිෂ්‍ය පිරිස 17%කි.
- මෙම ප්‍රශ්නය 3 (අ) කොටසෙහි පහසුතාව 42%ක් වන අතර අනෙක් කොටස් වල පහසුතාව 21%, 31%, 32%ක් වේ. මෙවැනි පහසුතාවක් සඳහා මාතෘකා ජනප්‍රිය නොවීම හා පෙළපොත පරිශීලනය දුර්වලතාවයක පැවතීම හේතු විය හැකි ය.
- ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරවීම, ඡායාරූප භාවිතය, තොරතුරු සංවිධානය කර ගැනීමට යොමු කිරීම මගින් සිසුන්ගේ දැනුම ඉහළ නංවාලිය හැකි ය.

## 07 ප්‍රශ්නය

**7.** පහත සඳහන් මාතෘකා යටතේ ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

(අ) ග්‍රීක යුගයේ සමාජය හා ජන ජීවිතය

(ආ) ග්‍රීක යුගයේ අධ්‍යාපනය හා දර්ශන වාද *(ලකුණු 06 × 2 = 12 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

07. (අ)
- ග්‍රීක සමාජය පුරවැසියන්, වහලුන් හා විදේශිකයින් වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වීම
- පුරවැසියන් අතර රදළ (ප්‍රභූන්) හා ගොවීන් වශයෙන් සමාජ මට්ටම් පැවැතීම
- වහලුන් එදිනෙදා කටයුතු සඳහා යොදා ගැනීම
- පුරුෂයාට ප්‍රධාන තැනක් හිමිවීම
- කාන්තාවන් ගේ දොර කටයුතුවල නියැලීම
- පුරවැසියන් සිය විවේක කාලය අධ්‍යාපනය හා වෙනත් නිර්මාණ සඳහා යොමු කිරීම

(ආ)
- අධ්‍යාපනය, ශාරීරික හා මානසික වශයෙන් පරිපූර්ණත්වයක් ලබා ගැනීම සඳහා යොමු කිරීම
- ග්‍රීක දාර්ශනිකයින් පහළ වීම, ඔවුන්ගේ දර්ශන, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්

**(ලකුණු 06 × 2 = 12යි)**

**07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අංක 3.4 ප්‍රස්තාරය අනුව 07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 6%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 79%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 0%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 0%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 04 - 06 දක්වා ලබාගෙන ඇත්තේ 21%ක් වන අතර 79%ක්, ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අදාළ කොටස් අතුරෙන් පහසුතාව වැඩිම (අ) කොටසෙහි පහසුතාව 18%කි. එසේම පහසුතාව අඩුම (ආ) කොටසෙහි පහසුතාව 17%කි.

- පැරණි යුරෝපීය ශිෂ්ටාචාරය ව්‍යාප්තිය හා සමාජ බලපෑම පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර එම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ශිෂ්‍ය පිරිස 7%කි.

- මෙම ප්‍රශ්නයේ (අ) කොටසෙහි පහසුතාව 18%ක් හා (ආ) කොටසෙහි පහසුතාව 17%ක් වේ. පොදුවේ ප්‍රශ්නය තෝරාගැනීමේ අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කිරීම හා ඉහළ සාධනයක් පෙන්නුම් නොකිරීමට ජනප්‍රිය නොවූ මාතෘකා ඇසුරින් මෙය සකස් වීම හේතු වන්නට ඇත.

- මෙවැනි ප්‍රශ්න සඳහා ආදර්ශ අභ්‍යාස කරවීම හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය සඳහා වැඩි අවධානය යොමු කරවීම මගින් ඒ පිළිබඳ දැනුම ඉහළ නංවාලිය හැකි ය.

08 ප්‍රශ්නය

**8. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.**

**(i) සොළොස් මහා ජනපද**

**(ii) මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය**

**(iii) සෝල්බරි ආණ්ඩුක්‍රමය**

**(iv) 1848 දෙවන නිදහස් සටන** *(ලකුණු 06 × 2 = 12 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

08. **(i)**
- ජනපද 16 ක් තිබීම
- මේවායේ රාජාණ්ඩු හා ගණ රාජ්‍ය පැවතීම
- මින් ජනපද හතරක් බලවත් වීම
- මගධයේ නැගී ඒම

**(ii)**
- බුරුමය (රාමඤ්ඤ දේශය) ආක්‍රමණය කිරීම
- පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීම

**(iii)**
- සෝල්බරි ආණ්ඩුක්‍රමය හඳුන්වා දීම
- ප්‍රධාන යෝජනා අග්‍රාණ්ඩුකාරවරයා, නියෝජිත මණ්ඩලය, සෙනෙට් සභාව, කැබිනට් ආණ්ඩුක්‍රමය (උත්තර මන්ත්‍රී මණ්ඩලය)
- ඒවා ක්‍රියාත්මක වීම

**(iii)**
- නිදහස් අරගලයට හේතු
- සටනේ නායකයෝ
- නිදහස් සටන ව්‍යාප්ත වීම
- සටන මර්ධනය කිරීම
- සටන අසාර්ථක වීම
- නිදහස් සටනේ ප්‍රතිඵල

**(ඉහත කරුණු ඇසුරින් විස්තරයට ලකුණු 06 × 2= 12යි)**

## 08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




අංක 3.4 ප්‍රස්තාරය අනුව 08 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 30%කි. මෙම ප්‍රශ්නය කොටස් දෙකක් සඳහා (6×2) බැගින් ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 03 ප්‍රාන්තරයේ 61%ක් ද
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 04%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති පිරිස 4%ක් වන අතර 62%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරෙන් පහසුතාව වැඩිම (iv) කොටසෙහි පහසුතාව 30%කි. එසේම පහසුතාව අඩුම (iii) කොටසෙහි පහසුතාව 6%කි.
- 4 හා 5 ශ්‍රේණිවල ඇතුලත් ප්‍රධාන මාතෘකා කිහිපයක් කෙරෙහි අවධානය යොමු කොට සංක්ෂිප්ත පිළිතුරක් සකස් කිරීමේ හැකියාව මැනබැලීම සඳහා මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර, එම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ශිෂ්‍ය පිරිස 30%කි.
- සමස්ත ප්‍රශ්නයේ (i) (ii) (iii) හා (iv) කොටස් සඳහා පිළිවෙලින් පහසුතාව 27%, 16%, 06 % හා 30%ක් වේ. මෙවැනි අඩු පහසුතාවක් සඳහා මාතෘකාවට අදාළ අවධානය අඩුවීම හා කරුණු සාරාංශ කර ගැනීමේ නොහැකියාව හේතු විය හැකි ය.
- මෙවැනි ප්‍රශ්නවල කොටස් සඳහා විශේෂ අවධානය යොමු කර ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඉඩ ප්‍රස්තා ලබා දීම හා කරුණු සාරාංශ කිරීමේ හැකියාව ඉහළ නැංවීම තුළින් සිසුන්ගේ දැනුම ඉහළ නංවාලිය හැකි ය.

## 3.6. II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.4 (RD/16/4/MPF) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකසන ලදී.

- ඉහත වගුවට අනුව 01 ප්‍රශ්නය අනිවාර්යය වුවත් අපේක්ෂකයන් අතරෙන් එම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීම අඩු ප්‍රතිශතයකි. එහි පහසුතාව 41%කි.
- ඒ සඳහා සිතියම් අභ්‍යාස කරවීම, පන්ති කාමරය තුළ නිවැරදි සිතියම් ප්‍රදර්ශනය කිරීම, රූප සටහන් හා ඒවා ඇසුරින් ප්‍රශ්න සකසා අභ්‍යාස කරවීම අත්‍යවශ්‍ය වේ.
- 02 ප්‍රශ්නය හා 03 ප්‍රශ්නවල පහසුතාව ඉහළ මට්ටම් පවතින නමුත් ප්‍රශ්නවල අනුකොටස්වලට අදාළ කරුණු සංවිධානය කර ගැනීමේ හැකියාව දුර්වල මට්ටමක පවතින හෙයින් ඒ සඳහා අභ්‍යාසවල නිරත කරවීම තුළින් සිසුන්ගේ අවබෝධය වැඩි කර ගත හැකි වනු ඇත.
- 04 ප්‍රශ්නයේ සිට 08 ප්‍රශ්නය දක්වා ප්‍රශ්න අතුරින් 05 ප්‍රශ්නය සඳහා පහසුතාව 41%කි. අවම පහසුතාව සහිත 7 ප්‍රශ්නය සඳහා පහසුතාව 18%කි.
- 07 ප්‍රශ්නය යුරෝපීය පැරණි ශිෂ්ටාචාර පිළිබඳ දැනුම හා අවබෝධය මැන බැලීම සඳහා ඇති එකම ප්‍රශ්නය යි. ඉතිහාසය විෂය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාව අපේක්ෂකයන් තුළ සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ නිසා අභ්‍යාස මෙන්ම වෙනත් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය භාවිතා කොට පුහුණුව ලබා දිය යුතු බවට යෝජනා කෙරේ.
- සමස්තයක් ලෙස මෙම II පත්‍රය දෙස අවධානය යොමු කිරීමේ දී 03 ප්‍රශ්නය වඩා ජනප්‍රිය වී ඇත. එහි පහසුතාව 81% වැඩි අගයකි. එමෙන්ම 07 ප්‍රශ්නය තෝරා ගැනීම අවම වේ. ප්‍රතිශතයක් ලෙස එය 6%කි. එහි පහසුතාව 18%කි. මෙම මාතෘකාව ලෝක ශිෂ්ටාචාර පිළිබඳව වන බැවින් සිසු අවධානය අඩු වීම මීට හේතු වන්නට ඇත. එමෙන්ම එහි අඩංගු කරුණු තමන්ට සමීප නොවීමෙන් මතක බලා ගැනීම දුෂ්කර විට ද හේතු ලෙස පෙන්වා දිය හැකිය.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු :

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් හොඳින් කියවා තේරුම් ගැනීමටත්, ප්‍රශ්න තෝරා ගැනීමටත් අමතර කියවීම කාලය යොදා ගත යුතුය. එම කාලය පිළිතුරු ලිවීම සඳහා යොදා නොගන්න.

- 1 වන ප්‍රශ්න පත්‍රයෙහි සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයිය යුතු ය. මෙහිදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන වරණය තෝරාගත යුතු ය.

- ප්‍රශ්න සඳහා නියමිත කාලය කළමනාකරණය කර ගත යුතු ය.

- II වන ප්‍රශ්න පත්‍රයේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විතය. 02 ප්‍රශ්නයේ සිට 08 ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්න 7 න් 4කට පිළිතුරු සැපයිය යුතු ය. කොටස් කිහිපයකින් යුතු ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී ඒ ඒ කොටසට නියමිත ලකුණු කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුර සංවිධානය කළ යුතු ය.

- සෑම පිළිතුරක්ම අලුත් පිටුවක් ආරම්භ කළ යුතු අතර. නිවැරදි හා පැහැදිලි අත් අකුරු වලින් පිළිතුරු සැපයිය යුතු ය. අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ නීති පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

- පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය පමණක් නිසි ලෙස භාවිතයට ගත යුතු ය.

- අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යයෙන්ම කළ යුතු ය.

- අපේක්ෂකයන් විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවකම පැහැදිලිව අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

- ලියන ලද පිළිතුරක් ඉවත් කිරීමට අවශ්‍ය වූ විට තනි ඉරකින් කපා දැමිය යුතු ය.

- පිළිතුරු ඇමිණීමේ දී අදාළ පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතු ය.

## 5.0. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා :

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දී අදාළ මාතෘකාවලට ගැළපෙන ඉගෙනුම් ආධාරක යොදා ගැනීම කළ යුතු ය.
- ★ නිවැරදි සිතියම් භාවිතා කරමින් සිතියම් ලකුණු කිරීමේ හා නම් කිරීමේ අභ්‍යාස නිරන්තරයෙන්ම සිදු කළ යුතු ය.
- ★ පෙළ පොත් පරිශීලනය සඳහා පෙළඹවීමක් ඇති කළ යුතු ය.
- ★ සිසුන්ගේ අභ්‍යාසකරණය දිරිමත් කළ යුතු අතර ඒ සඳහා නිසි ඇගයීමක් සිදු කළ යුතු ය.
- ★ ඉතිහාසය විෂය හැදෑරීමේ දී ඓතිහාසික ස්ථාන පිළිබඳ ප්‍රායෝගික දැනීම සංවර්ධනය වන පරිදි වැඩ සටහන් සකස් කළ යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.
- ★ විෂය අන්තර්ගතයට අදාළ බාහිර පොතපත් පරිශීලනය සඳහා සිසුන් යොමු කළ යුතු ය.
- ★ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා සිසුන් යොමු කළ යුතු අතර ඒ සඳහා අවස්ථාවක් සලසා දිය යුතු ය.
- ★ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මගින් කරුණු සංවිධානය කර ගැනීමේ කුසලතාව ඇති කළ යුතු ය.
- ★ ඡායාරූප, වීඩියෝ වැනි දේ භාවිතය තුළින් සිසුන් සිසු හැකියාවන් වර්ධනය කර ගැනීමට උපකාරී විය යුතු ය.